මුදු බව, තුලිත බව, හරවත් බව සහ රසවත් බව මුතුහර වැඩ සටහනේ පදනමයි. දරුවාගේ විවේක කාලය වඩාත් අර්ථවත්ව, වඩාත් පැහැබරව ගතකරමින් වැඩෙන දරුවා තම තාරුණ්‍ය වෙත ලගා වෙන්නේ පිරිපුන් පෞරුෂ ලක්ෂණයන්ගෙන් අනූන දරුවෙකු ලෙස බව මුතුහර පෙන්වා දෙයි. උතුම් මානව ගුණ ධර්මයන් හුරු පුරුදු වෙමින් වැඩෙන දරුවා සමස්ථ මානව ප්‍රජාවටම, සමස්ථ සමාජ පැවැත්මටම ආධාරයක් වනු ඇත. නවීන තාක්ෂණික ලෝකයට මතු පිවිසෙන දරුවා සෑම විටම ඉහත කරුණු පෙරදැරිව සමාජගත කිරීමට හැකි නම් එය අනාගතය වෙනුවෙන් කරන්නා වූ සමාජ සත්කාර්යයක් වන්නේය. මෙම වගකීම පැහැදිලිව වටහා ගනිමින්, එය යථාර්ථයක් බවට පත් කිරීමට ගන්නා එක් උත්සහයක් ලෙස මෙල්බර්න් මුතුහර මැයි මස කරලියට ගෙන එන ''විසිරා'' සාමූහික ප්‍රයත්නය සාක්ෂි දරනු ඇත.



# ''විසිරා'' සොයා යන අපේ දරුවෝ

මේ අපූරු නිර්මාණයේ පුහුණුවීම් දැක බලා ගැනීමට පසුගිය දිනෙක මම මුතුහර නිවසට ගොඩ වැදුනෙමි. ඉතා යුහුසුළුව, තුරුණු ජවයෙන් මුතුහර දූ දරුවන් ''විසිරා'' නිර්මාණයට සූදානම් වන ආකාරය දැක මේ අපූරු ''විසිරා'' කවුරුන් ද යැයි සොයන්නට වෙහෙසුනෙමි.

''විසිරා කියන්නේ අපේ සමාජයේ තියෙන චරිත කිහිපයක එකතුවක්. විසිරාව එක පාරටම හඳුනාගන්න, තේරුම් ගන්න බැහැ. ප්‍රේක්ෂකයින් විසිරාව එක එක විදිහට දකීවි. සමහර විට නූගතෙක් විදිහට, ඒත් මට තේරෙන විදිහට විසිරා නුවණක්කාර චරිතයක්. ඔහුට තියෙන්නේ පොතේ දැනුමට වඩා ලෝකය ගැන දැනුම. විසිරා, ස්ථානෝචිත ප්‍රඥාවන්තයෙක්. අපි මෙහෙම කියමු, ''විසිරා'' කියන්නේ හැම තැනම විසිරිලා ඉන්න චරිතයක්. විසිරා මිනිස් දුර්වලකම් පෙන්වා දෙනවා. වරින් වර වෙස් මාරු වෙන නිසා ඇත්තටම මටත් සමහර වෙලාවට මේ චරිතය තේරුම් ගන්න අමාරුයි. ඒ තරමට ගැඹුරුයි.''

මෙසේ මා සමග කතාබහට මුල පිරුවේ මෙම අපූරු චරිතයට පණ පොවන නෙමිසර නයිවලයි. මෙරට හැදී වැඩෙන දරුවෙකු ලෙසින් නෙමිසරගේ සිංහල භාෂා දැනුම සහ භාවිතය මා පුදුමයට පත් කළා. බස නිසි ලෙස හසුරුවන්නට හැකි වීමත්, ඔහු තුළ ඇති කැප වීමත්, ඔහුගේ දක්ෂතාවයත් මෙවැනි ගැඹුරු චරිතයක් කිරීමට ඔහුට තිබූ මූලික සුදුසුකම් විය හැකියි.

''මම මුලින්ම නාට්‍යයක රඟ පෑවේ සිංහල භාෂා පාසලේ 3 වසරේදී. මම මුතුහර සාමාජිකයෙක් වුනේ 7 වන වසරේදී. අද මම 10 වන වසරෙ සිසුවෙක්. මුතුහරේදී මට අපූරු අවස්ථාවක් ලැබුනා කුසුම්සිරි මාමා පවත්වපු රංගන පාඨමාලාවට සහභාගි වෙන්න. විසිරා මට ලැබුනේ වසර 2ක රංග අභ්‍යාසයෙන් පසුවයි.

''මොනවද මුලින්ම හිතුනේ නෙමිසර ''විසිරා'' වෙද්දි?

''මට ලොකු සතුටක් දැනුනා, මෙකෙද විසිරා කියන්නේ මේ නාට්‍යයේ ප්‍රධාන චරිතයනේ. ඒ වෙද්දි මම පිටපත කියවලා තිබුනේ ටිකයි. කුසුම්සිරි මාමා මේ පිටපත ලිව්වේ අපි අභ්‍යාසයේ යෙදෙද්දිමයි. ඒ නිසා, මෙහි එන හැම චරිතයකටම මුතුහරේ කෙනෙක් තෝරා ගත්තා. හැබැයි, අවාසනාවකට අපේ කණ්ඩායමේ හිටිය හැමෝටම කැපවීමෙන් ඒ පුහුණුවීම්වල යෙදෙන්න බැරි වුනා. සමහර යාළුවෝ මඟදී අතහැරියා. ඉතින් ඒ අඩුව මකන්න කුසුම්සිරි මාමාගේ Sri Lankan Theatre Group අයියලා අක්කලා කිහිප දෙනෙක් අපිත් එක්ක එකතු වුනා.''

විසිරා එක්ක ජීවත් වෙන්න පටන් අරන් ටික කාලයක් නේ, මොකද දැන් හිතෙන්නේ?

''මුලදී මට මේ චරිතය ගැන හරි අවබෝධයක් තිබුනේ නැහැ. පිටපත පිටු 40 ක් සිංහලෙන්. අපි හැමෝටම කාලයක් ගත වුනා ඒක තේරුම් ගන්න. පිටපතේ මට හුරු නැති ලොකු සිංහල වචන ගොඩක් මතක තියා ගන්න සිද්ධ වුනා. එතකොට තමයි ඇත්තටම මට බය හිතුනේ. මට හිතුනා මාමාගේ හිතේ ඇඳුනු විසිරා කරගන්න මට බැරි වේවි කියලා. මාමා නිතරම කිව්වේ ''නෙමිසරගෙන් ඈත් වෙලා විසිරා දිහා බලන්න'' කියලයි. මට සම්පූර්ණ නිදහස ලැබුනා මගේ චරිතය ගොඩ නගා ගන්න. අපි හැමෝටම. ඒක තමයි ලොකුම අභියෝගය වුනේ. මම තාමත් උත්සහ කරනවා හරියටම ''විසිරා'' හඳුනා ගන්න. කොහොම හරි මම ඒ විසිරාව මැයි 13 දාට වේදිකාවේදී පෙන්වනවා.''

''විසිරා'' නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා අප හොඳින් දැන හඳුනන කෙනෙක්. වරකෙ ඔහු මහැදුරු සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාටකයේ මනමේ කුමරු විය. මනමේ කුමරිය සරණ පාවා ගන්නේ ද ඔහුයි. මෙල්බර්න් ජීවත් වන ලාංකීය ළමා පරපුර උදෙසා වසර 10ක් පුරාවට නාට්‍ය නිර්මාණ රැසක් ඔහු දායාද කලේය. මේ මනමේ කුමරාත් ඒ මනමේ කුමරියත් නමින් කුසුම්සිරි ලියනාරච්චි සහ යශෝදරා සරච්චන්ද්‍ර ලෙස කවුරුත් හඳුනා ගනිති. ''විසිරා,'' ඒසරරදර සබඳෑ ඡමජ්බ ප්‍රජ්සකළුහ වූ කලි කුසුම්සිරි සහ යශෝදරාවන්ගේ දස වසරක රංග කලාවේ පෝෂණයෙන් නිර්මාණය වූ නාට්‍යයකි. යම් සාර්ථක පිටපතක් මතුපිටින් කියවා බැහැර කරන්නට නොහැකියි. එය, ගැඹුරු සමාජ කරුණු මෙන්ම මිනිස් ගුණ දහම් කියා දිය හැකි ප්‍රභල මාධ්‍යයක්. එමෙන්ම, ළමා නාට්‍ය නිර්මාණය කළ යුත්තේ දරුවාගේ මනසේ යහපත් ගතිගුණ ලියලන අයුරිනි. මනස සොම්‍ය කරන අයුරිනි. මෘදු කරන අයුරිනි. ඒ බැරෑරුම් මානසික ව්‍යායාමය කුසුම්සිරි ලියනාරච්චි නම් වූ අපූරු නිර්මාපකයා විසින් මැනවින් ඉටු කර ඇති බව නම් පැහැදිලියි.

''ඇත්ත, නාට්‍ය අභ්‍යාසයේ යෙදෙද්දි අපට රංගනය විතරක් නෙවෙයි ඉවසීම, අභියෝගයන්ට මුහුණ දීම, කණ්ඩායමක කටයුතු කිරීම, අන් අයගේ දක්ෂතාවයන් ඇගයීම, වෙලාවට කටයුතු කිරීම, ආත්ම විශ්වාසය ඇති කර ගැනීම වගේ වටිනා අත්දැකීම් ගොඩක් ලැබෙනවා. අපිත් එක්ක එකතු වෙලා ඉන්න theatre group අයියලා අක්කලාගෙන් අපි බොහෝ දේවල් මේ මාස කිහිපයේ දී ඉගෙන ගත්තා. ඒ එක්කෙනෙක් වෛද්‍ය ශිෂ්‍යයෙක්. තව කෙනෙක් නීතිය හදාරනවා. එයාලා ඒ වැඩ අතරේම තමයි අපේ මේ නාට්‍යයට එකතු වුනේ. එයාලා වගේ නෙමේ, අපි රංගනයට අළුත්. ඒත්, අපි දෙගොල්ලෝම බොහොම සහයෝගයෙන් ''විසිරා'' ගේන්න මහන්සි වෙලා පුහුණු වෙනවා.''





විසිරා - පුහුණු සැසියක දී

නෙමිසර එසේ කියාගෙනම නැවත පුහුණු වීමට එකතු වුණා. මට මගේ තරුණ කාලෙට ආපසු යා හැකි නම් කියා සිතුණේ ශාලාවෙන් ඇසුනු බෙර වාදනය හා මුසු වූ අපූරු ගීත ඛණ්ඩය නිසාවෙනි.

''යමන් පුතේ තිරික්කලේ
ලෝකේ වටේ සවාරියේ
ජීවිතේ අපේ සුන්දරයි -
ජීවිතේ අපේ මල් හතයි
එන්න එන්න අපිත් එක්ක -
ලෝකේ වටේ ගිහින් එන්න''

මෙල්බර්න් මුතුහර රූපවාහිනී ළමා සමාජය, Sri Lankan Theatre Group Melbourne සමඟ එක්ව මැයි මස කරලියට රැගෙන එන ''විසිරා,'' අනාගතය වෙනුවෙන් දියත් කළ සැබෑ ආයෝජනයක් වනු නොඅනුමානය.

**රුවනි දසනායක**